සන්නස

Sannasa
244 Princes Hwy
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
**www.sannasa.com**
email :sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**

**S Jayasinghe**
03 8707 4604
0402 025 516

**Anura Kulasekara**
0431 112 923

**email** ads.sannasa@gmail.com

**Account Details for Payments**

**Bank -** ANZ
**Branch -** 013312
**A/C number -** 254306608
**Name of A/C**
Sannasa News Group

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ
මහින්ද දිසානායක දිවුල්ගනේ

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku

**QLD**
Ananada Samaratunga
2, Santorini Pl.
Forest Lake
QLD 4078
(07) 3372 7958

**WA**
Ven Beruwala Sobhitha Thero
Sri Lanka Perth Budhdist Vihara

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**SA**
Chandra Eeriyagama
08 8331 2318

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත




## ලියන්නට කියවන්නට දන්නා නමුත්...

බොහෝ දෙනා ගල උඩ සටන ලෙස හැඳින් වූ විධායකය හා අධිකරණය අතර ගැටුම සිතූ ලෙසම රජය අවසන් කරන්නේ හිටපු අගවිනිසුරුතුමිය ගේ සියලුම අයිතීන් අහෝසිකර දමමිනි. රටක අධිකරණයක ඉහළම තැනට සාධාරණය ඉටුවන්නේ එලෙස නම් රිසානා රෆීක් දැරිය ගේ ඉරණම සම්බන්ධයෙන් ආණ්ඩුවේ ක්‍රියා පටිපාටිය ගැන කවර කතාද?

අධ්‍යාපන අවුල හා දෝෂාභියෝගය හරහා ආණ්ඩුවේ පැවැත්මට එල්ල වූ තර්ජනය වියැකෙමින් තිබියදී ඇති වූ රිසානා සිදුවීම සමස්ත සමාජයට මහත් කම්පනයක් ඇති කළ ද ඊට අඩක් හෝ වගකිවයුතු සෞදි තානාපති හා අදාල අමාත්‍ය ඩිලාන් පෙරේරා ද කිසිදු උපද්‍රවයකින් තොරව සුවසේ වෙසෙති.

නවතම ගැටලුව ආගම් විරෝධයයි. එයට ද රජය මේ ආකාරයේම විසඳුම් සොයා ගනු නියත ය.

ලියන්නට කියවන්නට දන්නා නමුදු සිතන්නට නොහැකි සමාජයක් පාලනය කිරීම, පාදඩ බලය සමාජය වෙත මුදා හරිමින් ඒ සමාජය බියෙන් මුසපත් කිරීම තමන්ගේ මූලික පාලන විධික්‍රමය කරගත් රජයකට බරපතල කාරණාවක් නොවේ.

ලංකාව තුළ ඇතිවන සෑම අරගලයක්ම දැන් අදාල වන්නේ අරගල කරන පාර්ශවයට පමණක් වන්නේත් පොදු ජනතාවට ඒවා අදාල නොවන්නේත් ඒ නිසා ය.

බුද්ධිමතුන් කලාකරුවන් මාධ්‍යකරුවන් ඇතුළු සිවිල් සමාජය මේ අයුක්තියට බිය ගැන්වීමට හිංසනයට එරෙහිව නැගී නොසිටීම තුළ ඇති වී ඇති මේ නිහැඩියාව විසින් විනාශකරනු ලබනු ඇත්තේ අපේ අනාගතය පමණක් නොව අනාගත පරම්පරාවේ ද ඉරණමයි. ඒ අනාගතය සුරැකීම පිණිස කරව හෝ අසාධාරණ පාලන ක්‍රමයකට එරෙහි වීම යුක්තිගරුක සෑම පුරවැසියෙකුගේම යුතුකමයි.

### නිදහස කාට ද?

තවත් නිදහස් දිනයක් උත්සව මැද නිමාවට පත්විය. කැටකිරිල්ලකට පවා නිදහසේ ජීවත්වන්නට හැකි සමාජයක් තනා ඇති බව ජනාධිපතිතුමා නිදහස් දිනය දා කියන විට එයට සතියකට දෙකකට පෙර කොළඹ දී සැමරුණ කලු ජනවාරිය පිළිබඳ මතකය අලුත් විය. මහින්ද රාජපක්ෂ රජය යටතේ නිදහස අහිමි වී ගිය ජනමාධ්‍යකරුවන් සියල්ල එක් වී මේ වසරේදීත් කලු ජනවාරිය සැමරුවේ අහිමි වීගෙන යන මාධ්‍ය නිදහස පිළිබඳ හඬක් නගන්නට ය.

රටේ නිදහස උපරිමයෙන් භුක්ති විඳීමේ වරප්‍රසාදය ඇත්තේ පාලකයන්ට හා ඔවුන්ගේ අතවැසියන්ට පමණකි. තමන් අත ඇති හැන්දෙන් ඇති තරම් බෙදා ගනිමින් විඳිනු ලබන පාලකයන්ගේ නිදහස වෙනුවෙන් කාබාසිනියා කරන ජාතික ධනය ගොඩ නැගී ඇත්තේ අහිංසක රිසානාලාගේ කඳුළු සහ දහඩියට පින්සිදුවන්නට බව නිදහස සමරණ මොහොතේදීවත් කාට හෝ මතක් වුණි ද?

සංස්කාරක



# ජාතිවාදය අවුලන්නේ කවුද?

## අනුර කුමාර දිසානායක අසයි

ආගම්වාදී හෝ ජාතිවාදී ගැටුම්වලට ඉඩ ප්‍රස්ථාව ලබා නොදෙන්නැයි ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයේ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක මහතා ඉල්ලා සිටියි. ජනවාරි 24 වන දා පාර්ලිමේන්තුව අමතමින් හෙතෙම මෙම ඉල්ලීම කළේය. එහිදී ඔහු මෙසේද සඳහන් කළේය.

ගරු කථානායකතුමනි, මේ වනවිට රට තුළ මහත් ආන්දෝළනයකට තුඩුදී තිබෙන මතභේදාත්මක ප්‍රවණතාවයන් පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි.

අපගේ ආදරණීය මව්බිමත් එහි වෙසෙන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ඇතුළු සියලූම ජනතාවන් මේ වනවිට ඉතාම බරපතළ සමාජ ආර්ථික දේශපාලන අර්බුදයක අනිටු ප්‍රතිවිපාකයන්ට මුහුණදී සිටී. දිනපතා වර්ධනය වන මෙම අර්බුදයන්ගෙන් පීඩාවට පත්ව සිටින්නේ පොදු ජනතාවය.

එක් අතකින් බඩුමිල වැඩිවීම නිසා ජීවන බර වැඩිවෙද්දී වැටුප් වැඩි නොවීම, ආදායම් පහළ වැටීම නිසා පොදු ජනයා ආර්ථික වශයෙන් පීඩාවට පත්ව තිබේ. අනෙක් අතින් ආර්ථිකය බහුජාතික සමාගම්වලට ගිල ගැනීමට ඉඩ සලසා දීම නිසා දේශීය නිෂ්පාදකයන් හා ව්‍යාපාර කඩා වැටෙමින් තිබේ. තවත් අතකින් ප්‍රජාතන්ත්‍රවාදය අනතුරට පත්කරමින් අධිකරණයට පවා අත තබද්දී, මානව හිමිකම් ප්‍රශ්න හා අභ්‍යන්තර ගැටුම් දඩමීමා කර ගනිමින් අධිරාජ්‍යවාදී විදේශ බලවේග අපේ රටට එරෙහිව ක්‍රියාත්මක වෙමින් තිබේ. එසේම රට තුළ අපරාධ වැඩිවෙමින් තිබේ. මෙම තත්වය තුළ අපේ රටේ සියලූ ජනතාව පීඩාවට හා දුෂ්කරතාවයට පත්ව තිබේ. ඒ අතර රට තුළ යළිත් ජාතිවාදී හා ආගම්වාදී ගැටුම් ඇවිළවීමේ ප්‍රවණතාවක්ද මතුවෙමින් තිබේ.

4 වන පිටට